Remove Watermark Now

# කැලණිය අධ්‍යාපන කලාපය
## දෙවන වාර පරීක්ෂණය - 2017
## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I

11 ශ්‍රේණිය                                                          කාලය පැය 03 යි

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් **සුදුසු** පිළිතුර තෝරන්න.

---

1. පරිගණක පරම්පරා සම්බන්ධ ව පහත සඳහන් ප්‍රකාශන සලකන්න.
   A – පළමු පරම්පරාවේ පරිගණක ක්‍රමලේඛනය සඳහා යන්ත්‍ර භාෂාව භාවිත විය.
   B – දෙවන පරම්පරාවේ පරිගණකවල දත්ත ආදානය සඳහා යතුරු පුවරුව සහ මූසිකය භාවිත විය.
   C – හතරවන පරම්පරාවේ පරිගණකවල විශාල ප්‍රමාණයේ අනුකලිත පරිපථ (Large Scale Integrated Circuits) භාවිත විය.
   ඉහත කුමන ප්‍රකාශය/ ප්‍රකාශ <u>සත්‍ය</u> වේ ද?
   (1) A පමණි (2) A සහ C පමණි (3) A සහ B පමණි (4) A, B සහ C සියල්ල ම

2. විභාග බහුවරණ උත්තර පත්‍ර ලකුණු කිරීම සඳහා බහුල ව භාවිත කරන සුපිරික්සකය (Scanner) වන්නේ,
   (1) චුම්භක තීන්ත අනුලක්ෂණ කියවනය (Magnetic Ink Character Reader)
   (2) ප්‍රකාශ සලකුණු සංජානනය (Optical Mark Recognition)
   (3) පැතලි තල සුපිරික්සකය (Flatbed Scanner)
   (4) ප්‍රකාශ අක්ෂර සංජානනය (Optical Character Recognition)

3. පහත දී ඇති උපක්‍රම (devices) සලකන්න
   A - තීරු කේත කියවනය (Barcode reader)
   B - සංයුක්ත තැටි ලියනය (CD writer)
   C - ඩිජිටල් කැමරාව (Digital Camera)
   ඉහත කුමන උපක්‍රම ආදාන හා ප්‍රතිදාන යන දෙකම සඳහා භාවිත කළ හැකි ද?
   (1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ල ම

4. යම් කාර්යයක් සඳහා මධ්‍ය සැකසුම් ඒකකයේ කාලය වෙන් කර ගැනීම, මතකය වෙන් කර ගැනීම සහ ආදාන හා ප්‍රතිදාන ඒකක වෙන් කර ගැනීම මෙහෙයුම් පද්ධතියක (Operating System) කුමන කළමනාකරණ කාර්ය සඳහා අදාළ වේ ද?
   (1) ක්‍රියාවලි කළමනාකරණය (Process Management)
   (2) මතක කළමනාකරණය (Memory Management)
   (3) උපාංග කළමනාකරණය (Device Management)
   (4) ආරක්ෂණ කළමනාකරණය (Security Management )

5. පහත දැක්වෙන්නේ ගොනු වර්ගය සහ ගොනුවේ දිගුව සහිත වගුවකි.

| | ගොනු වර්ගය | ගොනුවේ දිගුව |
|---|---|---|
| A | MS Word | .docx |
| B | MS Excel | .xlsx |
| C | MS Powerpoint | .psd |
| D | MS Access | .accdb |

   ඉහත වගුවෙහි ගොනු වර්ගයට අදාළ ගොනු දිගුව නිවැරදිව දැක්වෙන්නේ,
   (1) A හා B පමණි (2) A, B හා D පමණි (3) B, C හා D පමණි (4) A, B, C හා D

6. දශමය 101 සංඛ්‍යාවට තුල්‍ය ද්විමය සංඛ්‍යාව වන්නේ,
   (1) $1100101_2$ (2) $1010111_2$ (3) $1100000_2$ (4) $1100011_2$



papers.lk pdfelement

Remove Watermark Now

7. 011.1010$_2$ ද්විමය සංඛ්‍යාවේ වැඩිම වෙසෙසි බිටුව(Most significant Bit - MSB) හා අඩුම වෙසෙසි බිටුව (Least Significant Bit - LSB) පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) 0 හා 0 වේ (2) 0 හා 1 වේ (3) 1 හා 0 වේ (4) 1 හා 1 වේ

8. A අක්ෂරය නිරූපනය කරන ඇස්කි (ASCII) දශමය අගය 65 නම් CAB යන වචනයට අදාල ඇස්කි කේතය කුමක් ද?
(1) 1000001 1000011 1100011 (2) 1000011 1000001 1100000
(3) 1100011 1000011 1001111 (4) 1000011 1000001 1000010

9. පරිගණකවල භාවිත කෙරෙන කේත ක්‍රම (Coding System) දැක්වෙන පහත වගුව සලකන්න

| කේත ක්‍රමය | | භාවිතවන බිටු ගණන | |
|---|---|---|---|
| P | ASCII | A | 8 |
| Q | BCD | B | 7 |
| R | UNICODE | C | 4 |
| S | EBCDIC | D | 16 |

P Q R S කේත ක්‍රම සමග ගැලපෙන බිටු ගණන දැක්වෙන නිවැරදි ලේබල වන්නේ
(1) A B C D (2) B C D A (3) C D A B (4) D A B C

10. සංඛ්‍යාපාද පරිවර්තනය සම්බන්ධ පහත උපදෙස් ගුරු භවතා විසින් ඔබ වෙත සපයා ඇත


*- පළමුව දී ඇති සංඛ්‍යාව දකුණු කෙලවරේ සිට වම් කෙළවර දක්වා බිටු 3 බැගින් කාණ්ඩ වෙන් කර එක් එක් කාණ්ඩයට අදාළ දශමය අගය ලබාගන්න.*



*- දෙවනුව එම කාණ්ඩයට අදාළ දශමය සංඛ්‍යාව වෙන් වෙන් ව ලියන්න*

ඉහත විස්තරයට ආදාල නිවැරදි සංඛ්‍යා පද්ධති පරිවර්තනය පහත පිළිතුරු අතරින් තෝරන්න
(1) දශමය සංඛ්‍යා ද්විමය බවට පරිවර්තනය (2) ද්විමය සංඛ්‍යා ෂඩ් දශමය බවට පරිවර්තනය
(3) ද්විමය සංඛ්‍යා අෂ්ටමය බවට පරිවර්තනය (4) අෂ්ටමය සංඛ්‍යා ෂඩ් දශමය බවට පරිවර්තනය

11. 2GB සමාන මතක ධාරිතාවය දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න
(1) 8 bit (2) 1024 KB (3) 2048 MB (4) 4096 TB


12. දී ඇති සත්‍යතා වගුව මගින් දැක්වෙන තාර්කික ද්වාරය කුමක් ද?

(1)  (2) 

(3)  (4) 

| Input | | Output |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 1 |

13. පහත තාර්කික පරිපථය සලකා බලන්න




X = 1 වීමට A හා B සඳහා ආදානය කළ යුතු අගයන් වන්නේ
(1) A= 0 , B = 0 (2) A = 1, B = 0 (3) A = 0, B = 1 (4) A = 1, B = 1

14. සාමාන්‍ය භාවිතයේ ඇති යතුරු පුවරුවක සුවිශේෂී කාර්යය යතුරු (Function Keys) මගින් සිදු කරන කාර්යය තුනක් පහත දැක්වේ
- උදව් කවුළුව විවෘත කිරීම (Open Help Window)
- අක්ෂර වින්‍යාසය හරි වැරදි බැලීමේ සංවාද කවුළුව විවෘත කිරීම (Spelling &Grammar )
-ලේඛනය සුරැකීම සඳහා (Save As) සංවාද කවුළුව විවෘත කිරීම

ඉහත කාර්යයන් සඳහා සුදුසු Function Keys පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ
(1) F7, F1, F12 (2) F12, F2, F5 (3) F1, F7, F12 (4) F7, F5, F12



Papers.lk
pdfelement

Remove Watermark Now

15. වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතයෙන් සකස් කරන ලද ලේඛනයක වචන ප්‍රතිස්ථාපනය (Replace) කිරීම සඳහා භාවිත කළ හැකි කෙටිමං යතුර (Short Cut Key) වන්නේ

(1) Ctrl + O (2) Ctrl + V (3) Ctrl + H (4) Ctrl + A

16. වදන් සැකසුම් මෘදුකාංගයක පොදුවේ භාවිත කළ හැකි පිටු සැකසුම් (Page Setup) මෙවලමක් නොවන පිළිතුර කුමක් ද?

(1) පිටු සීමාව (Page Margins) (2) දිශානතිය(Orientation)
(3) කඩදාසිය ප්‍රමාණය(Paper Size) (4) පිටු අංකනය(Page Number)

17. වදන් සැකසුම් මෘදුකාංගයක කර්යයන් කිහිපයක් පහත දැක්වේ

A - වචන සෙවීම සහ ප්‍රතිස්ථාපනය (Find and Replace)
B - තැපැල් මුසුව (Mail Merge)
C - අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරණ දෝෂ සෙවීම (Spelling and grammar)
D - ශබ්ද නිධිය (Thesaurus)

සකස් කරන ලද ලේඛනයක 'network'යන වචනය වෙනුවට 'natwork' ලෙස ස්ථාන බොහොමයක යතුරු ලියනය වී ඇත. මෙය නිවැරදි කිරීම සඳහා වඩාත් සුදුසු වන්නේ

(1) A හා B (2) A හා C (3) B හා D (4) C හා D


18. ඉලෙක්ට්‍රොනික දත්ත සමුදායක් (Electronic Database) සම්බන්ධ පහත සඳහන් වගන්ති සලකා බලන්න.

A – දත්ත ඇතුළත් කිරීමේදී එකම දත්ත වගු කිහිපයක ඇතුළත් වීම දත්ත සමතිරික්තතාවය (Data Redundancy )ලෙස හැඳින් වේ.
B – එකිනෙක සම්බන්ධිත වගුවල දත්තවලින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා විමසුම (Query) භාවිත කරයි.
C – ආගන්තුක යතුර (Foreign Key) මගින් දත්ත සමුදායක වගු දෙකක් අතර සම්බන්ධතාවයක් ගොඩනැගෙයි.

ඉහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේ ද?

(1) A පමණි (2) B පමණි (3) A හා B පමණි (4) A ,B,C සියල්ල ම

අංක 19 සිට 20 දක්වා ප්‍රශ්න, පහත පෙන්වා ඇති සම්බන්ධිත දත්ත සමුදාය කොටස මත පාදක වී ඇත.




19. රෝගීන්ගේ වගුවේ ප්‍රාථමික යතුර ලෙස තෝරා ගැනීමට වඩාත් සුදුසු ක්ෂේත්‍රය (field) කුමක් ද?

(1) රෝගියාගේ අංකය (2) වෛද්‍ය අංකය
(3) රෝගියාගේ නම (4) වෛද්‍ය නම

20. වෛද්‍ය වගුවේ ක්ෂේත්‍ර (fields) ගණන දැක්වෙන පිළිතුර වන්නේ,

(1) 2 (2) 3 (3) 4 (4) 5

papers.lk pdfelement

Remove Watermark Now

21. පහත සඳහන් කුමන ක්ෂේත්‍රය ආගන්තුක යතුරක් සඳහා උදාහරණයක් වේ ද?
    (1) වෛද්‍ය වගුවෙහි වෛද්‍ය අංකය
    (2) රෝගීන්ගේ වගුවෙහි රෝගියාගේ අංකය
    (3) රෝගීන්ගේ වෛද්‍ය වගුවේ වෛද්‍ය අංකය
    (4) රෝගීන්ගේ වෛද්‍ය වගුවේ රෝගියාගේ අංකය හා වෛද්‍ය අංකය

22. දත්ත මධ්‍යස්ථාන (Data Center) පවත්වාගෙන යාමේ දී ඒවායේ සේවා දායක පරිගණකවල සංඛ්‍යාව එම මධ්‍යස්ථානයේ විදුලිය පිරිවැය කෙරෙහි බලපාන්නේ ද යන්න සොයා බැලීම සඳහා කීර්ති මහතා විසින් ආයතන කිහිපයක් සම්බන්ධ සංගණනයක් සිදු කරන ලදී.
    එයට අදාල කාර්යය කිහිපයක් පහත දැක් වේ.
    A - සංගණනයට අදාල දත්ත මධ්‍යස්ථාන 20 ක සේවාදායක පරිගණක සංඛ්‍යාව ලබා ගැනීම
    B - සේවාදායක පරිගණකවල සාමාන්‍ය අගය ලබා ගැනීම
    C - සංගණනයට අදාල ආයතන 20 ක සේවාදායක පරිගණක සංඛ්‍යාව හා විදුලිය පිරිවැය අගයන් සැසඳෙන පරිදි රේඛීය ප්‍රස්තාරයක් ප්‍රදර්ශනය කිරීම
    D - සංගණනයට අදාල දත්ත මධ්‍යස්ථාන 20 ක විදුලිය පිරිවැය ලබා ගැනීම
    E - විදුලි පිරිවැයෙ හි සාමාන්‍ය අගය ලබා ගැනීම
    මෙහි ආදාන (Input), ක්‍රියාවලිය (process) හා ප්‍රතිදාන (output) දක්වන පිළිතුර වන්නේ

| | ආදාන(Input), | ක්‍රියාවලිය(process) | ප්‍රතිදාන(output) |
|---|---|---|---|
| (1) | A හා D | B හා E | C |
| (2) | D හා E | A හා C | B |
| (3) | B හා E | A හා D | C |
| (4) | A හා B | D හා E | C |

23. පද්ධති සංවර්ධන ජීවන චක්‍රයෙහි විසඳුම් සැලසුම් කිරීමෙහි (Designing the Solution) පියවරට අයත් **<u>නොවන්නේ,</u>**
    (1) අතුරුමුහුණත් හා දත්ත ගබඩා සැකසුම.
    (2) ප්‍රධාන දෘඩාංග පද්ධති හා ඒවායේ සංඝටක හඳුනාගැනීම.
    (3) පද්ධතියේ හඳුනා නොගත් ගැටලුවලට පිළියම් යෙදීම.
    (4) පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා උචිත දෘඩාංග සහ මෘදුකාංග තීරණය කිරීම.

24. පද්ධති සංවර්ධන ජීවන චක්‍රයෙහි පරිශීලක අවශ්‍යතා සපුරාලීම සඳහා තොරතුරු එක්රැස් කළ යුතු වේ. පහත සඳහන් ඒවායින් තොරතුරු එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් <u>නොවන්නේ</u>,
    (1) මූලාදර්ශ (2) නිරීක්ෂණය (3) ප්‍රශ්නාවලි (4) පරීක්ෂණ සැලසුම්

25. අන්තර්ජාල පරිශීලකයින් වෙත අධ්‍යාපනික තොරතුරු සන්නිවේදනය කිරීමට යෝග්‍ය <u>නොවන</u> වෙබ් අඩවිය පහත පිළිතුරු අතරින් තෝරන්න.
    (1) <u>www.nie.lk</u> (2) www.moe.gov.lk
    (3) <u>www.edulanka.lk</u> (4) <u>www.amazon.lk</u>

26. පහත දැක්වෙන HTML කේත කොටස සලකන්න.

```
<html>
  <body>
      <ol type = "1" >
          <li>Sinhala</li>
          <li>Tamil</li>
          <li>Muslim</li>
          <li>Burgher</li>
      </ol>
  </body>
</html>
```

මෙම HTML කේතයෙහි ප්‍රතිදානය වන්නේ

(1) A. Sinhala
    B. Tamil
    C. Muslim
    D. Burgher

(2) 1. Sinhala
    2. Tamil
    3. Muslim
    4. Burgher

(3) • Sinhala
    • Tamil
    • Muslim
    • Burgher

(4) Sinhala
    Tamil
    Muslim
    Burgher

papers.lk
pdfelement

Remove Watermark Now

27. HTML උපුලනයක් මූලිකාංග (Element), ගුණාංග(Attributes) හා අගය(Value) ලෙස කොටස් තුනකි. පහත දී ඇති කේත කොටසේ මෙම කොටස් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න

<font size = "5" face ="Arial " color = "Red" >SRI LANKA </font>

| | මූලිකාංග (Element), | ගුණාංග(Attributes) | අගය(Value) |
|---|---|---|---|
| (1) | font | Red | color |
| (2) | font | size | 5 |
| (3) | face | Arial | font |
| (4) | SRI LANKA | font | 5 |

28. පහත සඳහන් වගන්ති සලකා බලන්න.

A – පරිගණක ජාලයෙහි ඇති පරිගණක අතර තොරතුරු හුවමාරුවේ දී ස්විචය (Switch) හුවමාරු කරනු ලබන තොරතුරු සියලුම පරිගණක වෙත යොමු කරයි.

B – පරිගණක ජාල දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක සම්බන්ධතාව ඇති කිරීමට නාභිය (Hub) යොදා ගනී.

C – පෞද්ගලික පරිගණක අන්තර්ජාලය හා සම්බන්ධ කිරීමට මොඩමය (Modem) යොදා ගන්නා අතර දත්ත පරිවර්තකයෙකු ලෙසද ක්‍රියා කරයි.

ඉහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේ ද?

(1) A පමණි (2) C පමණි (3) A සහ C පමණි (4) A, B සහ C පමණි

29. IP ලිපිනයක් (IP Address) නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ

(1) 172.64.85.45 (2) 78. 125. 0. 300 (3) 0.0.0.256 (4) 256.255.255.65

30. දුරස්ථ සෞඛ්‍ය රැකවරණය (Telemedicine) සම්බන්ධයෙන් අසත්‍ය වන්නේ කවර ප්‍රකාශය ද?

(1) අන්තර්සබැදි පරීක්ෂණ යන්ත්‍රයක් යොදා ගනිමින් රෝගියා නිවසේ රඳවා ඔහු/ඇයගේ තත්වය පරීක්ෂා කළ හැකිය.
(2) විශේෂඥ වෛද්‍යවරුන්ගේ සේවය ගම්බද ප්‍රදේශවල රෝගීනට ද ලබා ගත හැකිය.
(3) මෙහිදී රෝගියාට කිසිම අවස්ථාවක වෛද්‍යවරයා හමු වීම හෝ රෝහලට යාම අවශ්‍යය නොවේ.
(4) රෝහල් කාර්ය මණ්ඩලය පුහුණුව සඳහා ද යොදා ගත හැකිය.

ප්‍රශ්න අංක 31 හා 32 සඳහා පහත පැතුරුම්පත් කොටස භාවිත කරන්න

| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| 1 | 4 | 8 | 2 | 7 | |
| 2 | 7 | 3 | 1 | 2 | |
| 3 | 6 | 5 | 8 | 4 | |
| 4 | | | | | |

31. E2 කෝෂයේ , =B1 /D3 * A2+C2 සූත්‍රය ඇතුළත් කළවිට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) 17 (2) 10 (3) 20 (4) 15

32. A4 කෝෂයට පිළිතුර ලෙස 6 අගය ලබා ගැනීමට ඇතුළත් කළ යුතු නිවැරදි සූත්‍රය/සූත්‍ර ඇතුළත් පිළිතුර තෝරන්න

A = COUNT (A1:A3, C1: C3)
B = SUM (A1,C1)
C = AVERAGE (A1:A3,C2)

(1) A පමණි (2) B පමණි (3) A හා B පමණි (4) A B හා C සියල්ලම

Papers.lk pdfelement

Remove Watermark Now

33. ගුණාත්මක විද්‍යුත් සමර්පණයක (Presentation) අඩංගු විය යුතු ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ

A- එක් කදාවකට උචිත පේළි ප්‍රමාණය 6 – 9 ත් අතර වේ.

B- කදාවක පාඨවල (text) අකුරු ප්‍රමාණය පොයින්ට් 32 හෝ වැඩි විය යුතුය.

C- රූප, චිත්‍ර, වගු සහ ප්‍රස්තාර අන්තර්ගත කිරීම ඉ-සමර්පණය සකසන්නාගේ මනාපය මත සිදු කළ හැකිය

ඉහත කුමක් නිවැරදි වේ ද?

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A B හා C සියල්ලම

34. කාර්යාල මෘදුකාංග කට්ටලයක් ස්ථාපිත නොකළ අවස්ථාවක ඉ - සමර්පනයක් නිර්මාණය කිරීම සඳහා ලබා ගත හැකි ක්ලවුඩ් සේවාව (Cloud Services) නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) Apple Keynote (2) MS PowerPoint

(3) Google Presentation (4) LibreOffice Impress

35. පහත දී ඇති වගුව සලකන්න

| X | Y |
|---|---|
| A කාරක රීති දෝෂ (Syntax Error) | P වැරදි පද යෝජන |
| B තාර්කික දෝෂ (Logic Error) | Q වැරදි විරාම ලකුණු |
| | R අනපේක්ෂිත ප්‍රතිඵල |

මෙම වගුවේ X තීරයේ සහ Y තීරයේ අන්තර්ගතයන් අතර නිවැරදි සම්බන්ධය දෙනු ලබන පිළිතුර කුමක් ද?

(1) A සමග P හා Q (2) A සමග P හා R (3) B සමග Q හා R (4) B සමග P හා Q

36. පහත පැස්කල් ක්‍රමලේඛය සලකන්න

```
program WhileExample (input, output);
      var x   : integer;
      Begin
            x := 1;
            while x < 5 do
                  Begin
                  writeln(x);
                  x := x +1;
                  End;
            readln;
      End.
```

ඉහත ක්‍රමලේඛය ක්‍රියාතමක වූ පසු ලබා දෙන ප්‍රතිදානය කුමක් ද?

(1) 1 2 3 4 5

(2)
1
2
3
4

(3) 1 2 3 4

(4)
1
2
3
4
5

37. පහත දැක්වෙන ව්‍යාජ කේතය කොපමණ වරක් ක්‍රියාත්මකවේ ද?

```
Begin
      x = 0
      y = 1
      Repeat
            x = 2 * x +1
            y = y + 2
            Display x + y
      Until x>= y
End.
```


(1) 3 (2) 4 (3) 2 (4) 5



papers.lk
pdfelement

Remove Watermark Now

අංක 38 සහ 39 ප්‍රශ්න සඳහා, නිෂ්පාදන අයිතම (Item) පහක ලාභය (Profit) හෝ අලාභය (Loss) ගණනය කිරීමට සැලසුම් කරන ලද ගැලීම් සටහන සලකන්න




38 පහත දැක්වෙන කවරකින් ගැලීම් සටහනේ A හා B නිවැරදි පිළිවෙළින් නිරූපණය වේ ද?

(1) ItemNo<= 5 , ProfitItem = CP –SP (2) ItemNo< 5 , ProfitItem =SP –CP
(3) ItemNo<= 4 , ProfitItem = CP –SP (4) ItemNo< 4 , ProfitItem = SP –CP

39 ගැලීම් සටහනේ දී ඇති පාලන ව්‍යුහවලට අදාළ ව පහත කුමන ප්‍රකාශය නිවැරදි වේ ද?

(1) වරණය (Selection) තුළ පුනර්කර්ණ (Repetition) පැවතීම
(2) වරණය තුළ වරණය පැවතීම
(3) පුනර්කර්ණ තුළ වරණය පැවතීම
(4) පුනර්කර්ණ තුළ පුනර්කර්ණ පැවතීම

40 පහත දැක්වෙන පැස්කල් කේත ඛණ්ඩය සලකන්න

```
Program ExArray (input, output);
        var num : array [1..4] of integer;
        x : integer;
Begin
        num[1] := 45;
        num[2] := 15;
        num[3] := num[1] + 10;
        num[4] := num[2] + num[3];
                for x := 2 to 4 do
                write(num [x]);
        readln;
End.
```

ඉහත කේතය ක්‍රියාත්මක වූ විට ලබා දෙන නිවැරදි ප්‍රතිදානය කුමක් ද?

(1) 45 (2) 15 55 (3) 15 55 70 (4) 45 15 55 70

****

Remove Watermark Now
Papers.lk
pdfelement

Remove Watermark Now

**කැලණිය අධ්‍යාපන කලාපය**

**දෙවන වාර පරීක්ෂණය - 2017**

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය II**

**11 ශ්‍රේණිය**

- පළමුවැනි ප්‍රශ්නය හා තෝරාගත් කවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න
- පළමු ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක් ද, අනෙක් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද හිමි වේ.

1. (1) තද දම් පැහැයට අදාළ RGB දශමය අගයන් පිළිවෙලින් 135, 31, 120 වේ. මෙය ඇසුරින් තද දම් පැහැයට අදාළ ෂඩ්දශමය කේතය ලියන්න.

(2) නිෂ්පාදන කර්මාන්ත සඳහා සේවකයන් විශාල ප්‍රමාණයකගේ ශ්‍රමය භාවිතය වෙනුවට නවීන තාක්ෂණයෙන් නිපදවා ඇති රොබෝ යන්ත්‍ර යොදා ගනු ලබයි. මෙහි ඇති වාසි 2ක් ලියන්න

(3) තාර්කික ද්වාර අනුසාරයෙන් ක්‍රියාකරන යන්ත්‍රයක ධාරිතාව(Volume), උෂ්ණත්වය (Temperature) සහ වේගයට (Speed) අදාළ සිදුවීම් පහත දැක්වේ

| ආදාන(Input) | ද්විමය අගය (Binary No) | සැකසුම් තත්ව (Condition) |
|---|---|---|
| V | 1 | Volume > 1000 liters |
| | 0 | Volume <=1000 liters |
| T | 1 | Temperature > 750 $C^0$ |
| | 0 | Temperature <= 750 $C^0$ |
| S | 1 | Speed >15 meter/ second |
| | 0 | Speed <= 15 meter/ second |

ඉහත වගුවට අනුව යන්ත්‍රය ක්‍රියාවිරහිත වීමට ( X = 1) පහත සිදුවීම් බලපානු ලබයි

- උෂ්ණත්වය (Temperature) නොසලකා, ධාරිතාවය ලීටර 1000 ඉක්මවීම (Volume > 1000 liters) සහ වේගය තත්පරයට මීටර 15 හෝ 15 ට අඩු වීම (Speed <= 15 meter/ second)

හෝ

- ධාරිතාවය (Volume) නොසලකා, උෂ්ණත්වය 750 $C^0$ හෝ ඊට අඩු වීම (Temperature <= 750$C^0$) සහ වේගය තත්පරයට මීටර 15 ට වඩා වැඩි වීම(Speed >15 meter/ second)

ඉහත ක්‍රියාවලියට අදාළව තාර්කික ද්වාරය ඇඳ දක්වන්න.

(4) 11 ශ්‍රේණියේ පළමු වාර පරීක්ෂණය අවසානයේ පන්ති භාර ගුරු භවතා විසින් සිසුන්ගේ ලකුණු ලැයිස්තුව සකස් කරන ලදී. මෙහිදී පැතුරුම්පත් මෘදුකාංගයක් භාවිත කරන ලද අතර ශිෂ්‍යයින්ගේ නම්, විෂයන් සහ ඔවුන් ලබා ගත් විෂය ලකුණු ඇතුළත් කර මුළු ලකුණු, සාමාන්‍ය සහ තරාව (Rank) සැකසීමෙන් පසු අවසාන ලකුණු ලැයිස්තුවේ මුද්‍රිත පිටපතක් ලබා ගන්නා ලදී.

ඉහත ප්‍රකාශයට අදාළ ආදානය(Input), ක්‍රියාවලිය (Process) සහ ප්‍රතිදානය(Output) ලියන්න.



pdfelement Papers.lk

Remove Watermark Now

(5) පහත දී ඇති වගුවෙහි A සිට D දක්වා වන අක්ෂර මගින් නියමු (Guided) සහ නියමු නොවන (Unguided) මාධ්‍ය සම්බන්ධ ප්‍රකාශන දැක්වෙන අතර දෙවන තීරුවෙන් එම මාධ්‍ය දැක්වේ. ඒ අනුව පළමු තීරුවේ ප්‍රකාශනයට ගැලපෙන මාධ්‍ය දෙවනි තීරුවෙන් තෝරා ලියන්න.

(ප්‍රකාශනයට අදාළ අක්ෂරය සහ ඊට අදාළ මාධ්‍ය ඔබේ පිළිතුරු පත්‍රයේ දක්වන්න.)


| විස්තරය | මාධ්‍යය (Media) |
|---|---|
| A - තඹ කම්බි දැලක් ආකාරයට වූ පිටත කේබලය, මධ්‍ය කේබලය වටා විද්‍යුත් චුම්භකත්වයක් ඇති කරන අතර රූපවාහිනී ඇන්ටනා කේබල් ලෙස භාවිත වේ. | ක්ෂුද්‍ර තරංග (Microwaves) |
| B - දත්ත සම්ප්‍රේෂණයේ දී ආලෝකය පරාවර්තනය වෙමින් සම්ප්‍රේෂණය වන අතර නවීන දුරකථන ජාලවල භාවිත කරයි. | සමක්ෂක කේබලය (Coaxial cable) |
| C - රේඛීයව ගමන් කරමින් දීර්ඝ දුරකට දත්ත සම්ප්‍රේෂණය කරන අතර සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන එකිනෙක දර්ශනය විය යුතුය. | අධෝරක්ත කිරණ (Infrared) |
| D - රැහැන් රහිත යතුරු පුවරු සහ මූසික පාලනය සඳහා භාවිත කරයි. | ප්‍රකාශ තන්තු (Fiber optics) |

(6) දත්ත සමුදාය කළමනාකරණ පද්ධතික් (Database Management System – DBMS) ආධාරයෙන් සකස් කළ විමසුමක් (Query) පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| Field: | Full_Name | Science | Maths |
| Table: | Student Table | Marks Table | Marks Table |
| Sort: | | | |
| Show: | ☑ | ☑ | ☑ |
| Criteria: | | | |
| or: | | | |

Total ලෙස විමසුමේ නව තීරුවක් ගෙන එහි විද්‍යාව ලකුණු සහ ගණිතය ලකුණුවල එකතුව දැක්වීමට අදාළ ප්‍රකාශය ගොඩනගන්න.

(7) වදන් සැකසුම් මෘදුකාංගයක හැඩසව් ගැන්වීමේ කාර්යයන් සහ එම හැඩසවීමට අදාළ මෙවලම් පහත දක්වා ඇත

| | |
|---|---|
| (A) අකුරේ ප්‍රමාණය වර්ධනය කිරීම | (1)  |
| (B) ඉංග්‍රීසිඅකුරුවල කැපිටල් සිම්පල් මාරු කිරීම | (2)  |
| (C) අනුච්ඡේදනය කිරීම | (3)  |
| (D) පේළි පරතරය සකස් කිරීම | (4)  |


පළමු තීරුවෙහි ඇති කාර්යය අක්ෂරය, දෙවැනි තීරුවේ ඇති මෙවලම් අංකය සමග ගළපා ලියන්න.

(8) අන්තර්ජාලය සපයන සේවාවක් වන දුරස්ථ පිවිසුම (Remote Access) මගින් සැලසෙන වාසියක් හා අවාසියක් ලියන්න

Papers.lk
pdfelement

Remove Watermark Now

(9) පරිශීලකයා සහ පරිගණකය අතර සම්බන්ධය දැක්වෙන රූප සටහනක් පහත දැක්වේ. එහි (A) සහ (B) ලේබල සඳහා සුදුසු පද ලියා දක්වන්න.




(10) පහත දැක්වෙන පැස්කල් ක්‍රමලේඛයට අදාළ ප්‍රතිදානය නිවැරදිව ලියන්න.

```
Program forLoop1 (input,output);
   Var S, T : integer;
   Begin
         T := 1;
         For S:=  4 downto 1 do
         Begin
         Writeln(S, '-' ,  S+T);
         T := T+2;
         End;
         Readln;
   End.
```

2. (i) පහත දී ඇති වගුවේ පළමු තීරුවේ A සිට D දක්වා පරිගණකයට බාහිරින් සම්බන්ධ කරන උපාංග දැක්වෙන අතර එහි දෙවන තීරුවෙහි පරිගණක කෙවෙනි (Ports) ගැලපීමකින් තොරව දක්වා ඇත.

| | පරිගණක උපාංග | කෙවෙනි (Ports) |
|---|---|---|
| A | පරිගණක තිරය, ඩිජිටල් රූපවාහිනී යන්ත්‍ර, ඩිජිටල් ශබ්ද වාහිනී යන්ත්‍ර | USB |
| B | ජාල රවුටරය, ජාල ස්විචය | HDMI |
| C | පරිගණක තිරය බහුමාධ්‍ය ප්‍රක්ෂේපකය | RJ 45 |
| D | මොඩමය, මුද්‍රකය, මූසිකය, යතුරු පුවරුව | Video |

පළමු තීරුවේ දී ඇති උපාංග, දෙවන තීරුවේ ඇති කෙවෙනි සමග නිවැරදිව ගලපන්න. උපාංගයට අදාල අක්ෂරය හා නිවැරදි කෙවෙනිය පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) (a) පරිගණක පද්ධතියක් දෘඩාංග (Hardware) , මෘදුකාංග (Software), X හා Y යන අංගවලින් සමන්විත වේ . මෙම X හා Y ලෙස දැක්වෙන අංග නම් කරන්න.

(b) පරිගණකයක ආරම්භක ක්‍රියාවලිය අනුපිළිවෙළකින් තොර ව A සිට D මගින් පහත දැක්වේ.

A- Boot Drive හි ඇති මෙහෙයුම් පද්ධතිය සසම්භාවී ප්‍රවේශ මතකයට ප්‍රවේශ කිරීම

B- පරිශීලකයා විසින් විදුලි බලය සැපයීම හා CMOS මතකය අනුව සියළු දෘඩාංග පරීක්ෂා කර ඒවායේ ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම

C- පරිගණක නිෂ්පාදන සමාගම් සපයා ඇති උපදෙස් අනුව POST වැඩසටහනෙන් හඳුනා ගත් පළමු ආචයන උපක්‍රමයේ (Boot Drive හි) උපදෙස් කියවීම

D - මෙහෙයුම් පද්ධතිය (Operating System) පාලනය ලබාගෙන පරිශීලක අතුරු මුහුණත (User Interface) ලබා දීම

ඉහත ක්‍රියාවලියේ නිවැරදි අනුපිළිවෙළ අක්ෂර ලේබල මගින් දක්වන්න

Papers.lk pdfelement

(c) පද්ධති මෘදුකාංගයක් වන පරිගණක භාෂා පරිවර්තක වැඩසටහන් මගින් පරිගණක පද්ධතියට සැලසෙන සේවාව කෙටියෙන් පැහැදිලි කරන්න

(iii) මෙහෙයුම් පද්ධතියක ගොනු පද්ධතිය සම්බන්ධ, A සිට D දක්වා ලේබල කර ඇති පහත වගන්ති සලකන්න. අදාල ලේබලය යටතේ ඒවායේ <u>සත්‍ය</u>, <u>අසත්‍යතාව</u> සඳහන් කරන්න.

A -ගොනුවක් තැන්පත් කිරීමට හැකි ආචයන ධාරිතාවක්, ධාවකයක් (Drive) ලෙස හැදින්වේ.
B - ෆොල්ඩර් තැන්පත් කිරීමට ගොනු භාවිත කරයි.
C - ගොනුවක්, නාමයකින් හෝ දිගුවකින් (File extension) සමන්විත විය යුතුය.
D - Recycle Bin හි තාවකාලිකව තැන්පත් ව ඇති මකන ලද ගොනු නැවත ස්ථාපිත (Restore) කළ හැකිය.

3. (i) පහත a සිට d දක්වා ඇති වගන්තිවල හිස්තැන් පිරවීම සඳහා වඩාත්ම සුදුසු පදය වරහන් තුළ ඇති විකල්ප අතුරින් හඳුනා ගන්න. ප්‍රශ්න අංකය සහිත අක්ෂරය සහ අදාළ පදය පිළිතුරු පතෙහි ලියන්න.

(a.) වෙබ් අඩවි තුළ පවතින විවිධ සම්පත් අනන්‍යව හඳුනා ගැනීම සඳහා ................ යොදා ගනියි.
{ඒකාකාර සම්පත් නිශ්චායකය (URL), IP ලිපිනය, වසම් නාමය(Domain Name)}

(b.) ඒකාකාර සම්පත් නිශ්චායකය, IP ලිපිනය බවට පත් කිරීම.................. මගින් සිදු කරයි.
{ Web Server, Mail Sever, DNS Server}

(c.) වෙබ් අඩවිය තුළ පහසුවෙන් සැරිසැරීම සඳහා ...................... භාවිත කරයි.
{සෙවුම් යන්ත්‍ර(Search Engines), අධිසන්ධාන(Hyperlink), වෙබ් අතරික්සු (Web Browser)}


(d.) වෙබ් පිටුව සංදර්ශනය කළ යුතු ආකාරය වෙබ් අතරික්සුවට පෙන්වා දීම.......... මගින් සිදු කරයි
{ HTML, WWW, බිටු වේගය (bit rate)}

(ii) පහත රූපය 1 හි දක්වා ඇති වෙබ් පිටුව, රූපය 2 හි දක්වා ඇති මූල කේතය (source code) භාවිත කර නිර්මාණය කළ යුතුව ඇත.

**FLOODING IN SRI LANKA 2017**

Major floods in Sri Lanka are associated with the two monsoons. Typically, during the Southwest monsoon season (May-September) the western, southern and Sabaragamuwa provinces are vulnerable to floods. During the Northeast monsoon (December-February) the eastern, northern and north-central provinces are prone to flooding.

**Sri Lanka floods death toll exceeds 200**



Flood Records from Sky

Number of Flood Victims

| District | Death | Search |
|---|---|---|
| Kaluthara | 87 | 16 |
| Kelaniya | 25 | 8 |
| Gampaha | 4 | 0 |

Floods and landslides caused by torrential rains with gale force winds <u>Ministry of Disaster Management</u>

රූපය 1(මූලය: අන්තර්ජාලය)

Remove Watermark Now

```
<html>
<head>   <title> Sri Lanka </title>  </head>
<❻>
<center>  <❶> FLOODING IN SRI LANKA 2017</❶> </center>
 <❷ size ="5">      <p align = "justify"> Major floods in Sri Lanka are associated with the two monsoons. Typically,
during the Southwest monsoon season (May-September) the western, southern and Sabaragamuwa provinces are
vulnerable to floods.During the Northeast monsoon (December-February) the eastern, northern and north-central
provinces are  prone to flooding. </p>     </❷>
<❶ align = center> Sri Lanka floods death toll exceeds 200     </❶>
<center> <❸ src = "Flooding.jpg"    alt ="birds"      width ="500"    height ="300"     border ="3" >     </center>
<center>  <❷size = 4 color="red">    Flood Records from Sky  </❷> </center>
<center> <❶> Number of Flood Victims</❶>
          <❹border = "2"  height ="100" width ="400" bordercolor = "black" >
   <tr> <th>District  </th>          <th> Death</th>               <th> Search</th>  </tr>
  <tr> <td>Kaluthara </td>          <td> 87</td>                <td> 16</td>           </tr>
   <tr> <td>Kelaniya </td>          <td> 25</td>                <td> 8</td>            </tr>
   <tr> <td>Gampaha </td>          <td> 4</td>                 <td> 0</td>            </tr>
            </❹></center>
<center> <❷ size = 4> Floods and landslides caused by torrential rains with gale force winds
<❺ href = "www.disastermin.gov.lk"> Ministry of Disaster Management </❺> </❷> </center>
</❻>
</html>
```

රූපය 2

රූපය 2 හි දැක්වෙන කේතයෙහි ❶ සිට ❻ දක්වා ලේබල කර ඇති තැන් සඳහා HTML උසුලන(tag) පහත දී ඇති ලැයිස්තුවෙන් තෝරන්න

ලැයිස්තුව : head, a, font, body, table, img, h1, p,

ලේබල අංකය හා ඊට අනුරූපී HTML උසුලනය පමණක් ලියන්න.

4 එක්තරා පාසලක පවතින ක්‍රීඩාවන් සහ එම ක්‍රීඩා පිළිබඳ ලියාපදිංචි විස්තර ඇතුළත් දත්ත සමුදායක (Data Base) අඩංගු පහත වගු සලකා බලන්න.

ශිෂ්‍ය වගුව

| Stud_ID | Stud_Name |
|---|---|
| 084 | Smith |
| 085 | Kumar |
| 086 | Geetha |
| 087 | John |

ශිෂ්‍ය_ක්‍රීඩා වගුව

| Stud_ID | Activity_ID |
|---|---|
| 084 | 0002 |
| 084 | 0004 |
| 085 | 0001 |
| 086 | 0003 |
| 087 | 0001 |
| 087 | 0002 |

ක්‍රීඩා වගුව

| Activity_ID | Activity_Name | Monthly_Fee |
|---|---|---|
| 0001 | Tennis | Rs. 700 |
| 0002 | Swimming | Rs. 800 |
| 0003 | Golf | Rs. 1000 |
| 0004 | Squash | Rs. 500 |

(i) ඉහත දත්ත සමුදායේ ප්‍රාථමික යතුරු (Primary Key) දෙකක් අදාළ වගුවල නම් සමඟ ලියන්න.

(ii) අමන්දා (Amanda) මෙම ක්‍රීඩා සමාජයේ සාමාජිකත්වය ලබා ගැනීමට තීරණය කරන ලදී. ඇයට Tennis සහ Swimming යන ක්‍රීඩා සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය විය.
   a. කුමන වගු(ව) යාවත්කාලීන කළ යුතු වන්නේ ද?
   b. වගුවේ/වගුවල යාවත්කාලීන කළ යුතු පේළිය/පේළි ලියා දක්වන්න.

(iii) පාසල විසින් Golf ක්‍රීඩාව අත්හිටුවීම නිසා ගීතා (Geetha) ක්‍රීඩා සමාජයෙන් ඉවත් විය. මෙ හේතුවෙන් කුමන වගුව/ වගුවල දත්ත යාවත්කාලීන වන්නේ ද?

(iv) ක්‍රීඩා වගුවෙහි එක් එක් ක්ෂේත්‍ර (Field) නිරූපණය කිරීමට වඩාත්ම සුදුසු දත්ත ප්‍රරූප (Data Type) ලියන්න.

Remove Watermark Now

5. පහත දැක්වෙන පැතුරුම්පත මගින් 2011- 2015 වසර දක්වා ශ්‍රී ලංකාව තුළ නව රථ වාහන ලියාපදිංචිය පිළිබඳ සංඛ්‍යා ලේඛන පෙන්නුම් කරයි.


| | A | B | C | D | E | F | G | H | I | J |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | New Registation Of Vehicals in Sri Lanka | | | | | | | |
| 2 | | | | | | | | | | |
| 3 | | | Year | 2011 | 2012 | 2013 | 2014 | 2015 | | |
| 4 | | | Motor Cars | 57,886 | 31,546 | 28,380 | 38,780 | 105,628 | | |
| 5 | | | Motor Tricycle | 138,426 | 98,815 | 83,673 | 79,038 | 129,547 | | |
| 6 | | | Motor Cycles | 253,331 | 192,284 | 169,280 | 272,885 | 370,889 | | |
| 7 | | | Buses | 4,248 | 3,095 | 1,805 | 3,851 | 4,140 | | |
| 8 | | | Dual purpose vehicles | 33,518 | 37,397 | 24,603 | 20,799 | 39,456 | | |
| 9 | | | Motor Lorries | 14,818 | 12,266 | 5,872 | 5,121 | 6,602 | | |
| 10 | | | Land Vehicles-Tractors | 20,073 | 18,450 | 10,772 | 7,070 | 10,517 | | |
| 11 | | | Land Vehicles-Trailers | 3,121 | 3,442 | 2,266 | 2,012 | 2,128 | | |
| 12 | | | Total | | | | | | | |
| 13 | | | Min | | | | | | | |
| 14 | | | Max | | | | | | | |
| 15 | | | | | | | | | | |
| 16 | | | 2017 Ministry of Transport & Civil Aviation | | | | | | | |

(i) පහත ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට මෙම පැතුරුම්පත භාවිත කරන්න.

1. 2015 වසරෙ ලියාපදිංචි මුළු වාහන සංඛ්‍යාව සෙවිම සඳහා H12 කෝෂයේ ලිවියයුතු සූත්‍රය =function (cell1 : cell2) ආකාරයෙන් දක්වනු ලබයි. එහි function, cell1 සහ cell2 වලට අදාළ පද ලියා දක්වන්න
2. H12 කෝෂයේ ඇති සූත්‍රය D12 කෝෂයට පිටපත් කළවිට D12 හි දැක්වෙන සූත්‍රය කුමක්ද?
3. 2011 වසරේ වැඩියෙන්ම ලියාපදිංචි වූ වාහන ප්‍රමාණය සෙවීමට D14 කෝෂයෙහි ලිවියයුතු සූත්‍රය කුමක්ද?
4. දී ඇති වසර පහ තුළ ලියාපදිංචි යතුරුපැදි (Motor Cycles) සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස දැක්වීම සඳහා වඩාත්ම සුදුසු ප්‍රස්තාර වර්ගය කුමක්දැයි යෝජනා කරන්න.
5. ඉහත 4. හි පිළිතුරට අදාළ ප්‍රස්තාරය ඇඳීමට යොදා ගතයුතු කෝෂ පරාසය කුමක්ද?

(ii) ඉහත පැතුරුම්පතට අදාළ පහත කාර්යයන් කිරීමට උචිත මෙවලම්, රූප සටහනේ A සිට O දක්වා ලේබල අකුරින් තෝරා කාර්යය අංකයට ඉදිරියෙන් ලියන්න (ප්‍රමාණයට වැඩි මෙවලම් ඇති විට ලකුණු නොලැබේ)

1. C1 : H1 කෝෂ පරාසය සංයුක්ත කර එක් කෝෂයක් ලබා ගැනීම (Merge Cell).
2. D3: H3 කෝෂ අන්තර්ගතය ආනතව පිහිටුවීම (Orientation).
3. H12 කෝෂයට 2015 වසරේ ලියාපදිංචි මුළු වාහන සංඛ්‍යාව ලබා ගැනීමට Auto Sum භාවිත කිරීම.
4. වගුව වටා බෝඩරය (Border) යෙදීම




6. (i) එක්තරා රියදුරු පාසලක් පුහුණු කාලය අතරතුර සිසුන්ගේ ප්‍රගතිය සටහන් කර ගැනීම සඳහා අත්යුරු පද්ධතියක් භාවිත කරයි. එහි හිමිකරු විසින් මෘදුකාංග නිර්මාණය කරන ආයතනයක් හරහා අත්යුරු පද්ධතිය වෙනුවට පරිගණක පාදක තොරතුරු පද්ධතියක් නිර්මාණය කරවා ගැනීමට තීරණය කරන ලදී.

a. අත්යුරු තොරතුරු පද්ධතියක් සහ පරිගණක පාදක තොරතුරු පද්ධතියක් අතර වෙනස්කම් දෙකක් ලියන්න.

b. නව පද්ධතිය නිර්මාණය සඳහා පද්ධති සංවර්ධන ජීවන චක්‍රය භාවිත කිරීමට තීරණය වූ අතර එහි ප්‍රධාන පියවර 3 ක් ලියා දක්වන්න.

c. නව පද්ධතිය නිර්මාණය සඳහා සුදුසු පද්ධති සංවර්ධන ආකෘතියක් යෝජනා කරන්න.

Papers.lk pdfelement

Remove Watermark Now

d. නව පද්ධතිය නිර්මාණය කිරීමෙන් අනතුරුව විසඳුම් පරීක්ෂාව හා දෝෂ ඉවත් කිරීමේ පියවරේ දී හිමිකරු විසින් යෝජිත පද්ධතිය පරීක්ෂා කිරීම කුමන නමකින් හැඳින්වේ ද?

(ii) පරිගණකයක් මිලදී ගැනීමට ගිය සිසුවෙකුට වෙළඳසැල් හිමියා විසින් දෘඩාංග පිරිවිතර සටහනක් පෙන්වන ලදී.

| | |
|---|---|
| Processor 2.4 GHz | Monitor – LCD 22” |
| RAM 4GB | Keyboard – USB |
| VGA 2 GB | Mouse – USB |
| Hard Disk 500 GB | Speaker |

a. ඉහත දැක්වෙන උපාංග අතුරින් ආදාන උපාංගයක්, ප්‍රතිදාන උපාංගයක් සහ ආචයන උපාංගයක් ලියන්න.


b. Hard Disk හි ධාරිතාව MB වලින් දක්වන්න.

7. (i) දෙනු ලබන සංඛ්‍යාවකට අදාල ගුණන වගුව ප්‍රතිදානය කරන පහත ව්‍යාජ කේතය සලකන්න.

```
Begin
    Read MultiplicationNo
    Count = 1
        Repeat
            Multiple = MultiplicationNo * Count
            Print Count, 'X' MultiplicationNo, ' = ' ,Multiple
            Count = Count +1
        Until Count >12
End
```

ඉහත ව්‍යාජ කේතය නිරූපණය කෙරෙන ගැලීම් සටහන (Flow chart) අඳින්න.

(ii) 1 සිට 20 දක්වා සංඛ්‍යා පරාසය තුළ ඉරට්ටේ සංඛ්‍යාවල එකතුව පමණක් මුද්‍රණය කෙරෙන P සිට S ලේබලවලින් දක්වන හිස්තැන් සහිත පහත ගැලීම් සටහන සලකන්න.
P Q R හා S ලේබලවලට ගැලපෙන වගන්තිය හඳුනාගෙන ලියා දක්වන්න (ඔබේ පිළිතුරු පතට ගැලීම් සටහන පිටපත් කිරීම අවශ්‍ය නොවේ)




Papers.lk
pdfelement

****

Remove Watermark Now
pdfelement
Papers.lk